# කොටපොල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් බලපත්‍ර ගාස්තු පැනවීම

**<u>නිවේදනය</u>**

කොටපොල ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂයේ අගෝස්තු මස 28 වන දින තීරණ අංක 2023/08/28/88 යටතේ පහත දැක්වෙන තීරණය,තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එන්.එම්. දහනායක
ලේකම්
කොටපොල ප්‍රාදේශීය සභාව

2023 අගෝස්තු මස 28 වැනි දින,
කොටපොල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

**<u>තීරණය</u>**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ -

149 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ආ) ඡේදයෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, කොටපොල ප්‍රාදේශීය සභා පනතේ හෝ ඒ යටතේ සාදන ලද 1988.08.23 දින 520/7 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශිත සම්මත අතුරු ව්‍යවස්ථාව 2007.11.30 වැනි දින සභාව විසින් පිළිගෙන ඇති අතර, එම අතුරු ව්‍යවස්ථාවල 39 වැනි ඡේදය යටතේ කොටපොල ප්‍රාදේශීය සභා සීමාව තුළ කිසියම් තැනැත්තෙක් විසින් යම් වීදියකට, පාරකට, ඇළකට, දොළකට, වැවකට හෝ අහසට පෙනෙන පරිදි ප්‍රචාරක දැන්වීම් ඉදිකිරීම හා ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් මෙහි උප ලේඛනයේ 1 වන තීරුවේ නිරූපිත යම් ප්‍රචාරක දැන්වීමක් සඳහා 2 වන තීරුවේ නිරූපිත සීමාවක් තුළ වනවිට අනුරූප සටහනේ අනුප්‍රමාණ අනුව බලපත්‍ර ගාස්තුවක් 2024 වර්ෂය සඳහා පනවා අය කරන බව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වැනි වගන්තිය යටතේ කොටපොල ප්‍රාදේශීය සභාවේ ලේකම් වන නාඩකන්දගේ මල්ලිකා දහනායක වන මා විසින් තීරණ අංක 2023/08/28/88 යටතේ තීරණය කරන්නීය.

**උපලේඛනය**

| *අනු අංකය* | *01 වන තීරුව* | *02 වන තීරුව වර්ග අඩි එකකට රු. ශත* |
|---|---|---|
| 01. | ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීම් පුවරු සඳහා | 100.00 |
| 02. | ප්‍රදර්ශනය කරනු ලබන බැනර් එකක් හා කටවුට් එකක් සඳහා | 75.00 |
| 03. | බිත්තිවල පින්තාරු කරන ලද දැන්වීම් සඳහා | 100.00 |
| 04. | ඩිජිටල් හෝ එල්.ඊ.ඩී. බල්බ් වලින් ක්‍රියා කරන දැන්වීම් පුවරු සඳහා එක් වෙළඳ දැන්වීමකට දිනකට රු. 20.00 | |

**කොටපොල ප්‍රාදේශීය සභාව**

2024 වර්ෂය සඳහා අක්කර බද්ද පැනවීම

**<u>නිවේදනය</u>**

කොටපොල ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂයේ අගෝස්තු මස 28 වන දින තීරණ අංක 2023/08/28/89 යටතේ පහත දැක්වෙන තීරණය, තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එන්.එම්. දහනායක
ලේකම්
කොටපොල ප්‍රාදේශීය සභාව

2023 අගෝස්තු මස 28 වැනි දින,
කොටපොල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

**<u>තීරණය</u>**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ -

(අ) 146 වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, කොටපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි අක්කර බද්දට යටත් සෑම ඉඩමකම 2023 වර්ෂයේ දී බලාත්මක වූ සත්‍යාක්ෂණය 2024 වර්ෂයේ සත්‍යාක්ෂණය ලෙස පිළිගැනීමට,

(ආ) 134 වන වගන්තියේ (3) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, එකී උප වගන්තියේ පළමු අතුරු විධානය යටතේ 1989.03.10 දිනැති ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයකින් අක්කර බදු නියම කිරීමේ සහ අය කිරීමේ කාර්යය සඳහා පළාත් පාලන අමාත්‍යවරයා විසින් විශේෂ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශයේ පිහිටි හෙක්ටයාර් 01 කට නොඅඩු එහෙත් හෙක්ටයාර් 05 කට අඩු සෑම ඉඩමක් මත රුපියල් පනහක (50.00) අනුප්‍රමාණය අනුව වූ අක්කර බද්දක් සහ හෙක්ටයාර් 05 ක් හෝ ඊට වැඩි වන සෑම ඉඩමකම සෑම හෙක්ටයාරයකටම රුපියල් දහය (10.00) බැගින් වූ අක්කර බද්දක් 2024 වර්ෂයේ දී පනවා අය කිරීමට සහ,

(ඇ) 134 වන වගන්තියේ (6) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, යථෝක්ත බද්ද 2024 වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනවලින් අවසාන වන කාර්තු 4 තුළ දී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභාවට ගෙවන ලෙස බද්ද ගෙවීමට යටත් සෑම තැනැත්තෙකුට ම විධානය කරන බව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වැනි වගන්තිය යටතේ කොටපොල ප්‍රාදේශීය සභාවේ ලේකම් වන නාඩකන්දගේ මල්ලිකා දහනායක වන මා විසින් තීරණ අංක 2023/08/28/89 යටතේ තීරණය කරන්නීය.

---

**කොටපොල ප්‍රාදේශීය සභාව**

2024 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

**<u>නිවේදනය</u>**

කොටපොල ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂයේ අගෝස්තු මස 28 වන දින තීරණ අංක 2023/08/28/90 යටතේ පහත දැක්වෙන තීරණය, තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එන්.එම්. දහනායක
ලේකම්
කොටපොල ප්‍රාදේශීය සභාව

2023 අගෝස්තු මස28 වැනි දින,

කොටපොල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

## <u>තීරණය</u>

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ -

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ආ) ඡේදයෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, කොටපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මෙහි උපලේඛනයේ I වන තීරයේ නිරූපිත යම් කර්මාන්තයක් 2024 වර්ෂයේ දී කරගෙන යාම සඳහා නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් මත, එම කර්මාන්තය කරගෙන යනු ලබන පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම II වන තීරයේ නිරූපිත යම් සීමාවන් ඇතුළත් වන අවස්ථාවක අනුරූප සටහනේ සඳහන් අනුප්‍රමාණ අනුව වූ බලපත්‍ර ගාස්තුවක් පනවා අය කළ යුතු බවටත්, මීට අමතරව බලපත්‍ර ගාස්තුවෙන් 15% ක මුද්දර ගාස්තුවක් අය කළ යුතු බවටත් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වැනි වගන්තිය යටතේ කොටපොල ප්‍රාදේශීය සභාවේ ලේකම් වන නාඩකන්දගේ මල්ලිකා දහනායක වන මා විසින් තීරණ අංක 2023/08/28/90 යටතේ තීරණය කරන්නීය.

.

### බලපත්‍ර ගාස්තු

*උපලේඛනය 01*

| *අනු. අංකය* | Iවැනි තීරුව<br>*ව්‍යාපාරයේ ස්වභාවය* | IIවැනි තීරුව<br>*වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන විට*<br>*රු. ශත* | *වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා*<br>*රු. ශත* | *වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි*<br>*රු. ශත* |
|---|---|---|---|---|
| 01 | ලැගුම් නිවාසයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 02 | හෝටලයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 03 | බත් කඩයක්/ භෝජන ශාලාවක් හා තේ/ කෝපි කඩයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 04 | බේකරියක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 05 | රස කැවිලි හා පිසින ලද ආහාර නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 06 | කිරි පට්ටි හා කිරි නිෂ්පාදන වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 07 | මාළු විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 08 | මස් විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 09 | ලොන්ඩරියක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 10 | පෞද්ගලික වෙළඳ පොලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 11 | බාබර් සාප්පුවක්/ කොණ්ඩා සැකසීමේ සැලුන් එකක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 12 | සිසිල් බීම/ යෝගට් අයිස්ක්‍රීම් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 13 | සාතක මඩුවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 14 | සංචාරක වෙළඳාම | 500.00 | 750.00 | 1000.00 |
| 15 | සංචාරක මණ්ඩලයේ අනුමත හෝටල්/ ආපන ශාලා/ ලැගුම්හල්/ රෙස්ටුරන්ට් | පෙර වර්ෂයේ ආදායමෙන් 1% ක් බලපත්‍ර ගාස්තු වශයෙන් ගෙවිය යුතුය. | | |

---

**කොටපොල ප්‍රාදේශීය සභාව**

2024 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

**<u>නිවේදනය</u>**

කොටපොල ප්‍රාදේශීය සභාව විසින් 2023වර්ෂයේ අගෝස්තු මස 28 වන දින තීරණ අංක 2023/08/28/91 යටතේ පහත දැක්වෙන තීරණය, තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එන්.එම්. දහනායක
ලේකම්
කොටපොල ප්‍රාදේශීය සභාව

2023 අගෝස්තු මස 28 වැනි දින,
කොටපොල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

**<u>තීරණය</u>**

**1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර,**

(අ) කොටපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2024 වර්ෂයේ දී පවත්වාගෙන යනු ලබන මෙහි පහත උප ලේඛනයේ I වන තීරුවෙහි නිරූපිත යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් එම කර්මාන්තය කරගෙන යනු ලබන පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම එම උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණය අනුව වූ කර්මාන්ත බද්දක් 2024 වර්ෂයේ දී පනවා අය කිරීමට,

(ආ) 2023 වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දින පැවති යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් වූ විට යථොක්ත බද්ද 2024 ජුනි මස 30 වැනි දිනට ප්‍රථම කර්මාන්තය කරගෙන යනු ලබන තැනැත්තා විසින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි විධාන කිරීමට සහ,

(ඇ) 2024 වර්ෂයේ දී ආරම්භ කරනු ලබන යම් කර්මාන්තයක් වූ විට යථොක්ත බද්ද කර්මාන්තය ආරම්භ කර මාස 03 ක් ඇතුළත කර්මාන්තය කරගෙන යනු ලබන තැනැත්තා විසින් ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු යැයි විධාන කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වැනි වගන්තිය යටතේ කොටපොල ප්‍රාදේශීය සභාවේ ලේකම් වන නාඩකන්දගේ මල්ලිකා දහනායක වන මා විසින් තීරණ අංක 2023/08/28/91 යටතේ තීරණය කරන්නීය.

උපලේඛනය

**කර්මාන්ත බදු**

| *01 වන තීරුව* | | *02 වැනි තීරුව* | | |
|---|---|---|---|---|
| *අනු. අංකය* | *ව්‍යාපාරයේ ස්වභාවය* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම* | | |
| | | *රු.750 නොඉක්මවන විට රු. ශත* | *රු.751 සිට රු. 1,500 දක්වා රු. ශත* | *රු.1,500 ට වැඩි රු. ශත* |
| 01 | හුණු පිළිස්සීමේ හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 02 | ප්ලාස්ටික්, ෆයිබර් ග්ලාස් නිෂ්පාදන සිදුකරන කර්මාන්ත | 500.00 | 750.00 | 1000.00 |
| 03 | පුවක් වේළා සකස් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 04 | පැණි නිපදවීමේ/ හකුරු නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 05 | සාමාන්‍ය කම්මලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 06 | පපඩම් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 07 | කුරුඳු තෙල්, පැඟිරි තෙල් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 08 | විකිණීම සඳහා මිනිස් ශ්‍රමයෙන් ගල් කැඩීම | 500.00 | 750.00 | 1000.00 |
| 09 | ගල් වළක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 10 | හුණු පෝරණුවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 11 | දුම්කොළ සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 12 | සත්ත්ව ගොවිපළක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 13 | කුකුළු ගොවිපළක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 14 | කොප්පරා නිපදවන/ ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 15 | මෝටර් රථ නොම්මර තහඩු සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 16 | තේ පෙට්ටි හෝ ලෑලි පෙට්ටි සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 17 | ගෘහ භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 18 | හඳුන්කූරු නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 19 | රෙදි මෝස්තර මුද්‍රණය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 20 | විකිණීම සඳහා කුමන වර්ගයක හෝ පැළ තවානක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 21 | විසිතුරු භාණ්ඩ හෝ අත්කම් භාණ්ඩ නිපදවීමේ/ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 22 | ලියුම් කවර නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 23 | ඉදල්, කොහු, පාපිසි නිපදවන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 24 | වෙළඳාම සඳහා වැලි ගොඩ දැමීම | 500.00 | 750.00 | 1000.00 |
| 25 | ඇසිඩ් වර්ග නිපදවීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 26 | පින්තූර රාමු කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 27 | බැටරි චාජ් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 28 | විද්‍යුත් ලෝහාලේපනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 29 | මැටි ගඩොල් සකස් කිරීමේ හා පිළිස්සීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |

---

**කොටපොල ප්‍රාදේශීය සභාව**

2024 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

**නිවේදනය**

කොටපොල ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂයේ අගෝස්තු මස 28 වන දින තීරණ අංක 2023/08/28/92 යටතේ පහත දැක්වෙන තීරණය, තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එන්.එම්. දහනායක
ලේකම්
කොටපොල ප්‍රාදේශීය සභාව

2023 අගෝස්තු මස 28 වැනි දින,
කොටපොල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

## තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තියේ,

(අ) (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, කොටපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මෙහි පහත උපලේඛනයේ 02 හි නිරූපිත යම් ව්‍යාපාරයක් 2024 වර්ෂයේ දී පවත්වාගෙන යනු ලබන සෑම තැනැත්තෙකු මත එකී ව්‍යාපාරයේ 2023 වර්ෂයේ ආදායම උපලේඛනයේ 01 හි 1 තීරුවේ නිරූපිත යම් සීමාවක් ඇතුළත පවත්නා අවස්ථාවක II වන තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනු ප්‍රමාණය අනුව වූ බද්ද පනවා අයකිරීමට සහ,

(ආ) 03 වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, බද්දට යටත් සෑම තැනැත්තෙකු විසින් යථෝක්ත බද්ද 2024 වර්ෂයේ ජූනි මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු යැයි නියම කිරීමට කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වැනි වගන්තිය යටතේ කොටපොල ප්‍රාදේශීය සභාවේ ලේකම් වන නාඩකන්දගේ මල්ලිකා දහනායක වන මා විසින් තීරණ අංක 2023/08/28/92 යටතේ තීරණය කරන්නීය.

### ව්‍යාපාර බදු

උපලේඛනය - අංක 01

| අනු අංකය | I වැනි තීරුව<br>වර්ෂය සඳහා වූ ව්‍යාපාරයේ ස්වභාවය | II වැනි තීරුව<br>ගෙවිය යුතු බද්ද<br>රු. ශත |
|---|---|---|
| 01. | රු. 6,000 නොඉක්මවන අවස්ථාවක | කිසිවක් නොමැත |
| 02. | රු. 6,000 ට වැඩි අවස්ථාවල රු. 12,000 දක්වා | 90.00 |
| 03. | රු. 12,000 ට වැඩි අවස්ථාවල රු. 18,750 දක්වා | 180.00 |
| 04. | රු. 18,750 ට වැඩි අවස්ථාවල රු. 75,000 දක්වා | 360.00 |
| 05. | රු. 75,000 ට වැඩි අවස්ථාවල රු. 150,000 දක්වා | 1,200.00 |
| 06. | රු. 150,000ට වැඩි අවස්ථාවල | 3,000.00 |

උපලේඛනය - අංක 02

01. ගඩොල් විකිණීම සඳහා ගබඩා කිරීම
02. උළු විකිණීම සඳහා ගබඩා කිරීම
03. දර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
04. විකිණීම සඳහා හුණු/ හුණු ගල් ගබඩා කිරීම
05. විකිණීම සඳහා පත්තර කඩදාසි ගබඩා කිරීම
06. සත්ත්ව ආහාර ටොන් 01 ට වැඩියෙන් ගබඩා කිරීම
07. සිමෙන්ති විකිණීම සඳහා ගබඩා කිරීම
08. ගෘහ භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක්
09. විකිණීම සඳහා තේ කොළ හොන්ඩර 03 ට වඩා ගබඩා කිරීම
10. පරිගණක හා පරිගණක උපාංග අලෙවිය
11. කොමියුනිකේෂන් එකක් (දුරකථන ඇමතුම් ලබා ගන්නා ස්ථානයක්) පවත්වාගෙන යාම
12. කෙසෙල් කැන් එකතු කිරීමේ/ පුවක් එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
13. පූජා භාණ්ඩ අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
14. ස්නේහක තෙල් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
15. ශාරීරික ව්‍යායාම කරන ස්ථානයක් පවත්වාගෙන යාම
16. උපදේශන සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
17. සාප්පු බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
18. විදුලි උපකරණ අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
19. ශබ්ද විකාශන යන්ත්‍ර කුලියට දෙන ස්ථානයක් පවත්වාගෙන යාම
20. ගුවන් විදුලි/ රූපවාහිනී/ මහන මැෂින්/ බයිසිකල් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම

21. රෙදිපිළි වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
22. සම් භාණ්ඩ අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
23. ඇලුමිනියම්/ ප්ලාස්ටික් භාණ්ඩ අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
24. උත්සව භාණ්ඩ කුලියට දෙන ස්ථානයක් පවත්වාගෙන යාම
25. මහන මැෂින් නියෝජිත ස්ථානයක් පවත්වාගෙන යාම
26. පොත් සාප්පුවක් පවත්වාගෙන යාම
27. මෝටර් රථ/ මෝටර් බයිසිකල්/ ට්‍රැක්ටර්/ බයිසිකල්, ත්‍රීවිල් රථ අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
28. ලිපි ද්‍රව්‍ය වෙළඳසැලක් පවත්වාගෙන යාම
29. වීදුරු හෝ වීදුරු භාණ්ඩ අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
30. ආයුර්වේද බෙහෙත් බඩු අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
31. බටහිර බෙහෙත් බඩු අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
32. ආයුර්වේද වෛද්‍ය ප්‍රතිකාර කරන ස්ථානයක් පවත්වාගෙන යාම
33. බටහිර වෛද්‍ය ප්‍රතිකාර කරන ස්ථානයක් පවත්වාගෙන යාම
34. මැටි භාණ්ඩ වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
35. අවමංගල භාණ්ඩ නිෂ්පාදනය කරන හෝ අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
36. බුලත් වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
37. නිමි ඇඳුම් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
38. මෝටර් බයිසිකල්/ අත් ට්‍රැක්ටර්/ ත්‍රීරෝද රථ අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
39. ඡායා පිටපත් ගැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
40. සෙල්ලම් බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
41. පටිගත කිරීමේ හෝ තැටි ගත කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
42. රෙකෝඩ් බාර් එකක් පැවැත්වීම
43. ලොතරැයි අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
44. පරිගණක පුහුණු මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
45. විකිණීම සඳහා පොල් අතු ගබඩා කිරීම
46. අමු තේ දළු එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
47. පුවත්පත් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
48. අනුමැතිය ඇති රේස් ඔට්ටු පොළක් පවත්වාගෙන යාම
49. යකඩ බඩු/ ජල නළ උපකරණ/ පිත්තල උපකරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
50. කුරුඳු/ ගම්මිරිස්/ රබර් ආදී දේශීය ද්‍රව්‍ය විකිණීමේ හා මිලට ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
51. පොල් ලී ඇතුළු ඉරන ලද ලී විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
52. විදුලි උත්පාදන යන්ත්‍ර හෝ විදුලි උපකරණ කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
53. පිහන් භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
54. තොග වශයෙන් භාණ්ඩ විකිණීම සඳහා සිගරැට් ගබඩා කිරීම
55. කොන්ක්‍රීට් හෝ සිමෙන්ති භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
56. ප්ලාස්ටික් භාණ්ඩ හෝ නාම පුවරු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
57. ග්‍රොසරියක් පවත්වාගෙන යාම
58. සුරතල් මසුන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
59. විකිණීම සඳහා ටයර් ටියුබ් ගබඩා කිරීම
60. ජංගම දුරකථන විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
61. වෛද්‍යවරුන් චැනල් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
62. දුරකථන පෙර ගෙවුම් කාඩ්පත් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
63. තීන්ත බඩු අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
64. ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
65. මූල්‍ය ආයතනයක් පවත්වාගෙන යාම
66. පාවහන් වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
67. ස්වර්ණාභරණ වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
68. ගල්, වැලි, ගඩොල් ගබඩා කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
69. රක්ෂණ සේවා නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
70. වෛද්‍ය රසායනාගාරයක් පවත්වාගෙන යාම
71. අරක්කු/ බියර් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
72. පොහොර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

73. යන්ත්‍රානුසාරයෙන් ක්‍රියාකරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
74. ඇසිඩ් වර්ග විකිණීම හා ගබඩා කිරීම
75. කෘෂි රසායන ද්‍රව්‍ය විකිණීම හා ගබඩා කිරීම
76. ගිණිකෙළි භාණ්ඩ විකිණීම හා ගබඩා කිරීම
77. ගෑස් ගබඩා කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
78. විදුලි සංදේශ සම්ප්‍රේෂණ කුළුණු
79. ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙන යාම
80. තේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
81. සුපිරි වෙළඳසැලක් පවත්වාගෙන යාම
82. ජ්‍යොතිෂ්‍ය සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
83. ගෘහ නිර්මාණ සැලසුම් සකස් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
84. ලී මෝලක් පවත්වාගෙන යාම
85. ගල් මෝලක් පවත්වාගෙන යාම
86. සේවකයින් 25 ට වැඩි ඇඟලුම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
87. සිසිල් බීම අලෙවිය
88. ටයර් ටියුබ් අලෙවිය හා ටයර් ටියුබ් මාරු කිරීමේ හා සේවා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම
89. පිඟන් ගඩොල් සහ නාන කාමර කට්ටල විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
90. ඉදිකිරීම් කටයුතු කරන ආයතනයක් පවත්වාගෙන යාම
91. විසිතුරු භාණ්ඩ අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
92. විසිතුරු ආභරණ අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
93. තිර රෙදි බුමුතුරුණු මැසීම
94. නියෝජිත තැපැල් කාර්යාලයක් පවත්වාගෙන යාම
95. ජංගම දුරකථන අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
96. ළමා ඇඳුම් හා උපකරණ අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
97. වාහනවලින් පිටවන දුම් පරීක්ෂා කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
98. මාර්ග තැනීම සඳහා කොන්ක්‍රීට් ගල් කුට්ටි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
99. මිරිස්, ලූණු හා වෙනත් නරක්වන සුලු ආහාර වර්ග තොග වශයෙන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
100. පානීය ජලය බෝතල් කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
101. කුළු බඩු, හාල්, සීනි, කිරිපිටි සිල්ලර වශයෙන් විකිණීම
102. කුළු බඩු, හාල්, සීනි, කිරිපිටි තොග වශයෙන් විකිණීම
103. රියදුරු පුහුණු ආයතනයක් පවත්වාගෙන යාම
104. පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම
105. විකිණීම සඳහා ආහාර ද්‍රව්‍ය පැකට් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
106. වී මෝලක් පවත්වාගෙන යාම
107. තේ කොළ පැකට් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
108. වෑල්ඩින් වැඩපළක් පවත්වාගෙන යාම
109. සහල්/ මිරිස්/ තුනපහ පිටි කිරීම සඳහා මෝලක් පවත්වාගෙන යාම
110. ශීතකළ මස්/ මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
111. පොල්තෙල් මෝලක් පවත්වාගෙන යාම
112. බ්ලොක් ගල් නිපදවන ස්ථානයක් පවත්වාගෙන යාම
113. වඩු වැඩ සඳහා ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම
114. දත් බඳින, ගලවන ස්ථානයක් පවත්වාගෙන යාම
115. ත්‍රී රෝද රථ/ යතුරු පැදි/ අනෙකුත් වාහන සේවා සපයන (සර්විස් කිරීමේ) ස්ථානයක් පවත්වාගෙන යාම
116. පලතුරු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
117. ශීතකළ ආහාර ද්‍රව්‍ය (යෝගට්, බීම පැකට්, අයිස් ක්‍රීම්) විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
118. එළවළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
119. සංචාරය කරමින් බේකරි නිෂ්පාදන හා සිල්ලර වශයෙන් විකිණීම
120. බහුකාර්යය යන්ත්‍ර භාවිතා කරන වඩු මඩුවක් පවත්වාගෙන යාම
121. බයිසිකල් අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම
122. මෝටර් බයිසිකල්/ ත්‍රීරෝද රථ/අත් ට්‍රැක්ටර්/පාපැදි හෝ අනෙකුත් වාහන අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යෑම.
123. ටයර් ටියුබ් වෝල්කනයිස් කරන ස්ථානයක් පවත්වා ගෙන යෑම.
124. ස්වර්ණාභරණ නිපදවන ආයතනයක් පවත්වා ගෙන යෑම.

125. ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම.
126. ගුවන් විදුලි/රූපවාහිනී/මහන මැෂින්/සියලුම වර්ගයේ විදුලි උපකරණ අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වා ගෙන යාම.
127. ඔරලෝසු අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම.
128. සපත්තු, කුඩ අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වා ගෙන යාම
129. කුෂන් වැඩපළක් පවත්වාගෙන යාම
130. තුනපහ කුඩු/මිරිස් කුඩු පැකට් කිරීමේ / විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යෑම
131. ග්‍රිල් ගේට්ටු හෝ යකඩ/වානේවලින් විවිධ භාණ්ඩ හා උපකරණ නිපදවන ස්ථානයක් පවත්වාගෙ යාම.
132. රූපලාවන්‍යාගාරයක් පවත්වා ගෙන යාම
133. නාම පුවරු/දැන්වීම් පුවරු/බැනර් සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
134. ජංගම දුරකථන අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම
135. රන්, රිදී,ලොහාලේපනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
136. ශීතකරණ, අධි ශීතකරණ හෝ වායු සමීකරණ අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම
137. මෝටර් රථ විදුලි කාර්මික ස්ථානයක් පවත්වාගෙන යාම
138. ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
139. වානේ ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම
140. වාහන වායු සමීකරණ පද්ධති අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම
141. පෞද්ගලික පෙර පාසල් හෝ දිවා සුරකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
142. ලංකා විදුලි බල මණ්ඩලයේ කොන්ත්‍රාත් පදනමට මාර්ගය දෙපස ගස්/අතු කපා ඉවත් කිරීමේ කටයුතු කරන ආයතනයක් පවත්වාගෙන යාම.
143. ඖෂධීය තෙල් වර්ග නිෂ්පාදනය කිරීම
144. බහාලුම් ප්‍රවාහනය කිරීම
145. පෞද්ගලික විදුලි බලාගාරයක් පවත්වාගෙන යාම
146. රන්, රිදී, ලෝහ හා වෙනත් භාණ්ඩ උකස් ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
147. කොන්ත්‍රාත් ක්‍රමයට සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
148. කුලී පදනමට, බදු පනමට වාහන සැපයීමේ ව්‍යාපාරයක් පවත්වා ගෙන යාම
149. මාර්ගගත ක්‍රමයට ව්‍යාපාර කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
150. කාබනික පොහොර / කාබනික තෙල් වර්ග නිෂ්පාදනය හා අලෙවි කිරීම.
151. විකිණීම සඳහා බිම්මල් වගා කිරීම
152. විසිරි පින්තාරු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
153. තොරතුරු රැස්කොට වාර්තා සකස් කිරීමේ ( ගිණුම්/ විගණන/ නීතිඥ) කාර්යාලයක් පවත්වාගෙන යාම.

**කොටපොල ප්‍රාදේශීය සභාව**

2024 වර්ෂය සඳහා වෙනත් ගාස්තු පැනවීම

**නිවේදනය**

කොටපොල ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂයේ අගෝස්තු මස 28 වන දින තීරණ අංක 2023/08/28/93 යටතේ පහත දැක්වෙන තීරණය, තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එන්.එම්. දහනායක
ලේකම්
කොටපොල ප්‍රාදේශීය සභාව

2023 අගෝස්තු මස 28 වැනි දින,

කොටපොල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

**තීරණය**

2024 වර්ෂය සඳහා වෙනත් ගාස්තු පැනවීම තීරනය.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් කොටපොල ප්‍රාදේශිය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පහත උප ලේඛනයේ 1 වන තීරුවේ සඳහන් අයිතමයක් සඳහා II වන තීරුවේ සඳහන් ගාස්තුවක් 2024 ජනවාරි 01 දින සිට පනවා අය කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වැනි වගන්තිය යටතේ කොටපොල ප්‍රාදේශීය සභාවේ ලේකම් වන නාඩකන්දගේ මල්ලිකා දහනායක වන මා විසින් තීරණ අංක 2023/08/28/93 යටතේ තීරණය කරන්නීය.

උපලේඛනය - අංක 01

| I වැනි තීරුව | | II වැනි තීරුව |
|---|---|---|
| අනු අංකය | අයිතමය | ගාස්තුව |
| 01. | ඒ.ටී.පෝරම (ඔප්පු සාරාංශ පෝරම) | 150.00 |
| 02. | ගොඩනැගිලි අයදුම් පත්‍ර ගාස්තු | 500.00 |
| 03. | අනතුරුදායක ගස් කැපීමේ අයදුම්පත්‍ර ගාස්තු | |
| | ➢ කොස් ගසක් සඳහා | 1000.00 |
| | ➢ වෙනත් ගසක් සඳහා | 500.00 |
| 04. | ගොඩනැගිලි අයදුම්පතක් මත අනුකූලතා සහතිකයක් සඳහා | |
| | ➢ ව්‍යාපාරික ස්ථානයක් සඳහා | 1000.00 |
| | ➢ පදිංචි ස්ථානයකට | 500.00 |
| 05. | ගොඩනැගිලි අයදුම්පතක් කාලය දීර්ඝ කරගැනීම සඳහා | |
| | ➢ එක් වර්ෂයකට | 1000.00 |
| 06. | වරිපනම් සහතික ගාස්තු | 250.00 |
| 07. | ජල සහතික ගාස්තු | 250.00 |
| 08. | වීථි රේඛා සහ නොපවරා ගැනීමේ සහතික ගාස්තු | 500.00 |
| 09. | අයාලේ යන ගවයින් සඳහා (එක් ගවයෙකුට දිනකට) | 500.00 |
| 10. | කැබලි සැලසුම් අනුමත කිරීමේ පෝරම ගාස්තු | 300.00 |
| 11. | කැබලි සැලසුම් අනුමත කිරීමේ ගාස්තු එක් කැබැල්ලකට | 500.00 |
| 12. | ඉඩම් අනුකොටස්වලට බෙදීමේ දී කැබලි සැලසුම් අනුමත කිරීමේ ගාස්තු | |
| | ව.මී. 150 – 300 දක්වා (එක් කැබැල්ලක් සඳහා) | 500.00 |
| | ව.මී. 301 – 600 දක්වා (එක් කැබැල්ලක් සඳහා) | 400.00 |
| | ව.මී. 601 – 900 දක්වා (එක් කැබැල්ලක් සඳහා) | 300.00 |
| | ව.මී. 900ට වැඩි (එක් කැබැල්ලක් සඳහා) | 200.00 |
| 13. | කාර්යාල ලේඛන උද්ධෘත පිටපත් නිකුත් කිරීම | 250.00 |
| 14. | සභාව සතු භූමි ප්‍රවර්ධන කටයුතු සඳහා ලබා දීම (එන් දිනක් සඳහා) | 1000.00 |
| 15. | සභාව සතු වේදිකාව සහිත ප්‍රධාන ශ්‍රවණාගාරය කුලියට ලබා දීම | 7500.00 |
| 16. | ශ්‍රවණාගාරය සඳහා සභාවේ පුහුණු ශ්‍රමිකයෙකුගේ සේවය ලබා දීම (එක් දිනක් සඳහා) | 1500.00 |
| 17. | කර්මාන්ත සඳහා අයකරන ලිපි ද්‍රව්‍ය හා සුභ සාධන ගාස්තු | |
| | ➢ ප්‍රජා පාදක සමිති මගින් සිදු කරන කර්මාන්ත සඳහා | 1000.00 |
| | ➢ කොන්ත්‍රාත්කරුවන් මගින් සිදු කරන කර්මාන්ත සඳහා | 2000.00 |
| 18. | ආදාහනාගාර සේවාව ලබා දීම සඳහා | |
| | ➢ බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙකුගේ මරණයක් ආදාහනය කිරීම සඳහා | 8000.00 |
| | ➢ බල ප්‍රදේශයෙන් පිටත ස්ථිර පදිංචිකරුවෙකුගේ මරණයක් ආදාහනය කිරීම සඳහා | 9000.00 |
| 19. | කොටපොල ප්‍රාදේශීය සභාවේ රථ වාහන කුලී පදනම මත සැපයීම සඳහා ගාස්තු අය කිරීම 2024 වර්ෂය | |
| 20. | බැකෝ රථය කුලී පදනම මත සැපයීම - පැයකට | 5000.00 |
| 21. | ගල් රෝල කුලී පදනම මත සැපයීම - දිනකට | 12000.00 |
| 22 | ගල් රෝල කුලී පදනම මත සැපයීමෙන් පසුව රඳවාගෙන සිටින කාලසීමාව තුළ එක් දිනකට | 1000.00 |

| | | |
|---|---|---|
| 23 | HF2299 ටිපර් රථය - 100km ඇතුළත එක් දිනක් සඳහා (ඊට වැඩි වන 1km කට රු. 100 බැගින්) | 20000.00 |
| 24. | ජල බවුසරය කුලියට දීම - එක් දිනක් සඳහා පමණක් කුලියට දීම | 3000.00 |
| 25 | ජල බවුසරය කුලියට දීම - ට්‍රැක්ටර් එන්ජිම සමග ජලය පුරවා බල ප්‍රදේශය තුළ රැගෙන ගොස් භාර දීමට | 6000.00 |
| 26. | ජල බවුසරය කුලියට දීම -ට්‍රැක්ටර් එන්ජිම සමග ජලය පුරවා බල ප්‍රදේශයෙන් පිටත රැගෙන ගොස් භාර දීමට 7500+( ඊට වැඩි වන 1km කට රු. 100 බැගින්) | 7500.00 |
| 27 | ජල බවුසරය කුලියට දීම - (- ට්‍රැක්ටර් එන්ජිම සමග ජලය පුරවා බල ප්‍රදේශය තුළ රැගෙන ගොස් භාර දීමට) අමතරව වැඩිවන එක් වාරයක් සඳහා | 3000.00 |

**<u>මූලික සැලසුම් නිරාකරණය නිකුත් කිරිම සහ අලුත් කිරිම සඳහා වන පෙරසැරි ගාස්තුව</u>**

1. ඉඩම් අනුබෙදුම් කිරිම ඉඩම් ප්‍රමාණය (ව.මි.) ගාස්තුව (රුපියල්)
   - I. ව.මි. 150 – 500 2000/-
   - II. ව.මි. 501-1000 3000/-
   - III. ව.මි. 1001-5000 7500/-
   - IV. ව.මි. 5001- 10000 ඉන් රු. 10000/- + ව.මි. 10000 ට වැඩි සෑම ව.මි . 1000 ට හෝ කොටසකට රු. 1000 බැඟින්
2. සන්නිවේදන කුළුණු / ඇන්ටනා කුළුණු/ ඇන්ටනා කුළුණු / සම්ප්‍රේෂණ කුළුණු ඉදි කිරිම රු 30000/-
3. වෙනත් සංවර්ධන කාර්යයන් සඳහා
   - I. ව.මි. 400 දක්වා 5000/-
   - II. ව.මි. 401- ව.මි. 500 10000/-
   - III. ව.මි. 501- ව.මි. 750 25000/-
   - IV. ව.මි.751- ව.මි. 1000 50000/-
   - V. ව.මි. 1000 වැඩි හෝ රු 50000/- ව.මි. 1000 වැඩි වන සෑම ව.මි .100 ක් සඳහාම ඉන් කොටසකට රු 500 බැඟින්
4. ගෙබිම් ප්‍රමාණය වෙනස් නොවී අනුමත සැලසුමේ - ව.මි. 1000ක් දක්වා රු 5000/- සිදුකරනු ලබන අභ්‍යන්තර වෙනස් කිරිම් ව.මි 1000ක් වැඩි රු 10000/-
5. කඩිනම් සේවය ( සියලුම අවශ්‍යතා හා අදාළ අනෙකුත් ලේඛන සම්පූර්ණ කරන ලද දින 07 ක් තුළ) - සාමාන්‍යය ගාස්තුව මෙන් හතර ගුණයක් අය කළ යුතුය.
6. ආගමික කටයුතු හා අඩු ආදායම් නිවාස ව්‍යාපෘති වලට අදාළ ගාස්තු - 5000/- පරිපාලන ගාස්තුවකට යටත් වේ.

**<u>සංවර්ධන බලපත්‍ර නිකුත් කිරිම හා කාලය දීර්ඝ කිරිම වන පෙරසැරි ගාස්තු</u>**

1. ඉඩම් අනු බෙදුම් සඳහා
   - ව.මි. 150-300 කැබලි 1 ක් සඳහා රු. 1000
   - ව.මි. 301-600 කැබලි 1 ක් සඳහා රු .800
   - ව.මි. 601-900 කැබලි 1 ක් සඳහා රු. 600
   - ව.මි. 900 වැඩි කැබලි 1ක් සඳහා රු.500
2. මායිම් තාප්ප / රැඳවුම් බැම් ඉදිකිරිම දික් මීටර් 1 සඳහා රු. 100
3. සන්නිවේදන කුළුණු / ඇන්ටනා කුළුණු/ සම්ප්‍රේෂණ කුළුණු ඉදිකිරිම - රු 40000/-

4. ඉන්ධන පිරවුම්හල් /වාහන සේවා ස්ථාන/ දුම් පරීක්ෂා කරන ස්ථාන - ව.මී. 1 කට රු. 100/-

| ගෙබිම් ප්‍රමාණය (ව.මී. 1ට ) | නේවාසික (ව.මී.) තනි පුද්ගල | නේවාසික නොවන |
|---|---|---|
| ව.මී. 400 දක්වා | රු.08/- | රු 25/- |
| ව.මී.401-1000 | රු.12/- | රු.27/- |
| ව.මී. 1001-1500 | රු.15/- | රු.30/- |
| ව.මී. 1501-2000 | රු.18/- | රු.32 |
| ව.මී. 2000 ට වැඩි | වැඩිවන සෑම ව.මී.90 ක් සඳහාම රු2000/- බැගින් | වැඩිවන සෑම ව.මී.90 ක් සඳහාම රු2000/- බැගින් |

5. වාණිජ පරමාර්ථයෙන් කරනු ලබන

I. පිහිනුම් තටාක (තටාකයේ ඩෙක් සමඟ) ව.මී. 300 දක්වා රු 6000
ව.මී 301-500 රු 15000

II. සූර්ය පැනල සඳහා වන ගාස්තු ව.මී. 501-1000 රු.30000

III. ව.මී.1000 වැඩි රු.30000/- + වැඩිවන සෑම ව.මී. 100 හෝ ඉන් කොටසක් සඳහා රු. 1000/- බැගින්

6. අනුමත සැලසුමට අමතරව ගෙබිම් ප්‍රමාණය වැඩි වන සේ සිදුකරන වෙනස් කිරීම් හා එකතු කිරීම්- මුළු පෙරසැරි ගාස්තුවෙන් 25% + වැඩි වන අමතර වර්ග ප්‍රමාණය සඳහා පෙරසැරි ගාස්තුව
7. ගෙබිම් ප්‍රමාණය වෙනස් කිරීමක් නොමැතිව අනුමත සැලසුම තුළ සිදු කරනු ලබන වෙනස් කිරීම් - මුල් අනුමැතියේදී ගෙවන ලද පෙරසැරි ගාස්තුවෙන් 25%

8. සංවර්ධන බලපත්‍රයක් වෙනත් පාර්ශවයකට පැවරීම - 25000/-
9. සංවර්ධන බලපත්‍රයේ වලංගු කාලය වසරකින් දීර්ඝ කිරීම - ව.මී. 1,000 දක්වා රු 2,000/-
ව.මී. 1,000 ට වැඩි රු 4,000/-
10. දැන්වීම් පුවරු
    I. ඩිජිටල් දැන්වීම් පුවරු (ව.මී.1ට) රු.2500/-
    II. ඩිජිටල් නොවන දැන්වීම් පුවරු (ව.මී.1ට) රු. 1500/-
    III. නාම පුවරු (ව.මී. 1ට) රු 500
    IV. මාර්ගයට ඉහළින් මාර්ගය හරහා පවතින දැන්වීම් පුවරු (ව.මී.1ට ) රු 1000/-

## <u>භාවිතය වෙනස් කිරීම සඳහා සේවා ගාස්තු</u>

**1.** පෙරසැරි ගාස්තු

| ගෙබිම් ප්‍රමාණය (ව.මී) | ගාස්තුව (රුපියල්) |
|---|---|
| 45 දක්වා | 1000/- |
| 45-90 | 1500/- |
| 91-180 | 1750/- |
| 181-270 | 2000/- |
| 271-450 | 2500/- |
| 451-675 | 2750/- |
| 676-900 | 3000/- |
| 900 ට වැඩි | වර්ග මීටර් 900 ට වැඩිවන සෑම වර්ග මීටර් 90 ක් සඳහාම රු.500/- බැගින් |

2.අවසර පත්‍ර සඳහා ගාස්තු

1. නේවාසික භාවිතයන් සඳහා වෙනත් භාවිතයක් සඳහා යොදා ගැනිම - වර්ග මීටරයක් සඳහා රු 750/-
2. නේවාසික නොවන අනිකුත් භාවිතයක් වෙනත් භාවිතයක් සඳහා යොදා ගැනීම - වර්ග මීටරයක් සඳහා රු 500/-

## ආවරණ අනුමැතිය ලබාදීම සඳහා වන සේවා ගාස්තුව

1. අවශ්‍ය අනුමැතිය ලබා නොගෙන සිදු කරන ලද ඉඩම් බෙදීමක් සඳහා -ඉඩම් කැබලි 1ක් සඳහා රු 3,000/- බැගින්

| 2. | අනුමැතියින්තොරවගොඩනැඟිලිඉදිකිරීම් /එකතුකිරීම් /නැවත ඉදි කිරීම. | නේවාසික (ව.මී.1 ට) | නේවාසික නොවන(ව.මී.1) |
|---|---|---|---|
| I. | අත්තිවාරම් වැඩ පමණක් සම්පූර්ණ කර ඇති විට(කයිරු මට්ටම් දක්වා) | 200/- | 500/- |
| II. | වහල් මට්ටම දක්වා ඉදිකිරීම් ටැම් සහ බාල්ක ඇතුළුව ඉදිකර ඇති විට (වහල හැර) | 300/- | 1000/- |
| III. | වහලය සහිත බිත්ති ඉදිකිරිම | 400/- | 1500/- |
| IV. | පදිංචිවීම සඳහා සුදුසු පරිදි ඉදිකිරීම් සම්පූර්ණ කිරිම | 500/- | 2000/- |
| V. | මායිම් තාප්ප /රැදවුම් බිත්ති ඉදිකිරිම | 200/-(දික් මීටරයක්සඳහා) | 500/-(දික් මීටරයක්සඳහා) |
| VI. | විදුලි සංදේශ.සම්ප්‍රේෂණ සහ ඇන්ටනා කුළුණු ඉදිකිරිම | වර්ග මීටර් 1*1000 | |

3. අනුකූලතා සහතික (COC) ලබා නොගෙන පදිංචි වීම - දිනකට රු 100/-
4. වාහන නැවැත්වීමේ ස්ථාන (පරිශ්‍රය තුළ ලබා දී නොමැති විට එක් එක් වාහන නැවැත්විමේ ඉඩ සඳහා සේවා ගාස්තු) - සියලුම වාහන සඳහා 25,0000/-
5. රථ වාහන නැවැත් විමේ ඉඩ වෙනත් භාවිතයන් සඳහා භාවිත කිරිම - අනුමත - එක ඉඩකඩක් සඳහා රු 20,000/- ක් සහ සැලසුම පරිදි වාහන නැවැත්වීමට පර්වර්තනය වන තෙක් වසරකට 10% ක වර්ධනයක් සහිතව.
6. ජල විදුලි ව්‍යාපෘති සඳහා ගාස්තුව - රු 50,0000/-

## අනුකූලතා සහතිකය නිකුත් කිරිම සඳහා ගාස්තුව

1. ඉඩම් අනු බෙදුම් කිරිම - එක් කැබැල්ලකට රු 1,000/-

1. ගොඩනැඟිලි ඉදිකිරිම

| ගොඩනැඟිලි ඉදිකිරිමගෙබිම් ප්‍රමාණය (ව.මී.) | නේවාසික | නේවාසික නෙවන |
|---|---|---|
| ව.මී.400 දක්වා | රු.4,000 /- | රු.5,000/- |
| ව.මී. 400 ට වැඩි | රු.4,000/+ව.මී 400ට වැඩිවන සෑම ව.මී.1ට ම හෝ ඉන් කොටසක් සඳහා රු 15/- බැගින් | රු.5,000/+ව.මී400ට වැඩිවන සෑම ව.මී.1ටම හෝ ඉන් කොටසක් සඳහා රු 25/- බැගින් |

2. සන්නිවේදන කුළුණු ,ඇන්ටනා කුළුණු/සම්ප්‍රේෂණ කුළුණු සඳහා - රු.5000/-
3. මායිම් තාප්ප හා රැදවුම් බැම් - දික් මීටර් ට රු.25/- බැගින්

**4.** පොදු ගොඩනැඟිලි සඳහා වන අනුකූලතා සහතිකය අළුත් කිරිම. - රු.10000/-

---

**කොටපොල ප්‍රාදේශීය සභාව**

2024 වර්ෂය සඳහා කසළ ශෝධන ගාස්තු පැනවීම

<u>නිවේදනය</u>

කොටපොල ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂයේ අගෝස්තු මස 28 වන දින තීරණ අංක 2023/08/28/94 යටතේ පහත දැක්වෙන තීරණය, තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එන්.එම්. දහනායක
ලේකම්
කොටපොල ප්‍රාදේශීය සභාව

2023 අගෝස්තු මස 28 වැනි දින,
කොටපොල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

<u>තීරණය</u>

2024 වර්ෂය සඳහා කසළ ශෝධන ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය සහ 126 IX (ආ) වගන්තිය ප්‍රකාරව ලැබී ඇති බලතල මත කොටපොල ප්‍රාදේශීය සභාව විසින් 2007.11.30 වැනි දින සම්මත කරගත් 1988.08.23 දින 520/07 පොදු අතුරු ව්‍යවස්ථාවේ (04) අනුව කසළ ශෝධන සේවා මගින් සේවය සපයනු ලබන යම් ස්ථානයක පදිංචිකරුවෙකු/ ව්‍යාපාරිකයෙකු වෙනුවෙන් පහත සඳහන් පරිදි කසළ ශෝධන සේවා ගාස්තුවක් 2024 වර්ෂයේ ජනවාරි මස සිට මාස්පතා පනවා අයකිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වැනි වගන්තිය යටතේ කොටපොල ප්‍රාදේශීය සභාවේ ලේකම් වන නාඩකන්දගේ මල්ලිකා දහනායක වන මා විසින් තීරණ අංක2023/08/28/94 යටතේ තීරණය කරන්නීය.

| අනු අංකය | අයිතමය | ගාස්තුව |
|---|---|---|
| 01. | සර්විස් සෙන්ටර්/ ගරාජ් | 600.00 |
| 02. | හෝටලයක්/ ආපනශාලාවක් සඳහා/ බාබර් සාප්පු | 400.00 |
| 03. | පලතුරු/ එළවළු කඩයක් සඳහා | 450.00 |
| 04. | වෙනත් ව්‍යාපාර | 250.00 |
| 05. | ගෘහස්ථ | 130.00 |

**කොටපොල ප්‍රාදේශීය සභාව**

2024 වර්ෂය සඳහා විනෝද බදුපැනවීම

**නිවේදනය**

කොටපොල ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂයේ අගෝස්තු මස 28 වන දින තීරණ අංක 2023/08/28/95 යටතේ පහත දැක්වෙන තීරණය, තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එන්.එම්. දහනායක
ලේකම්
කොටපොල ප්‍රාදේශීය සභාව

2023 අගෝස්තු මස 28 වැනි දින,
කොටපොල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

**තීරණය**

විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව අදාළ සංදර්ශන, ප්‍රසංග මගින් අලෙවි කරනු ලබන මුළු ප්‍රවේශ පත්‍ර හා සංදර්ශන ටිකට් පත් වල මුලු වටිනාකමින් 10% ක විනෝද බදු මුදලක්කොටපොල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බව 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 9(3) වැනි වගන්තිය යටතේ කොටපොල ප්‍රාදේශීය සභාවේ ලේකම් වන නාඩකන්දගේ මල්ලිකා දහනායක වන මා විසින් තීරණ අංක 2023/08/28/95 යටතේ තීරණය කරන්නීය.

**.කොටපොල ප්‍රාදේශීය සභාව**

2024 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

**නිවේදනය**

කොටපොල ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂයේ අගෝස්තු මස 28 වන දින තීරණ අංක 2023/08/28/96යටතේ පහත දැක්වෙන තීරණය, තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එන්.එම්. දහනායක
ලේකම්
කොටපොල ප්‍රාදේශීය සභාව

2023 අගෝස්තු මස 28 වැනි දින,
කොටපොල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ -

(අ) 146 වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, කොටපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශයේ පිහිටි සෑම නිශ්චල දේපළකම 2023 වර්ශයේදී බප පැවැත්වූ වාර්ශික වටිනාකම 2024 වර්ශයේ වාර්ශික වටිනාකම ලෙස පිළිගැනීමට,

(ආ) 134 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව,කොටපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශයේ පිහිටි සෑම නිශ්චල දේපළකම වාර්ශික වටිනාකම 2024 වර්ශයේ වාර්ශික වටිනාකමින් 6%ක වරිපනම් බද්දක් 2024 වර්ශයේ දී පනවා අය කිරීමට, සහ

(ඇ) 134 වන වගන්තියේ (6) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, යථෝක්ත වාර්ශික වරිපනම් බද්ද 2024 වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දින වලින් අවසාන වන කාර්තු 4 තුළ දී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභාවට ගෙවන ලෙස බද්ද ගෙවීමට යටත් සෑම තැනැත්තෙකුට ම විධානය කරන බව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වැනි වගන්තිය යටතේ කොටපොල ප්‍රාදේශීය සභාවේ ලේකම් වන නාඩකන්දගේ මල්ලිකා දහනායක වන මා විසින් තීරණ අංක 2023/08/28/96 යටතේ තීරණය කරන්නීය.

**කොටපොල ප්‍රාදේශීය සභාව**

2024 වර්ෂය සඳහා සංචාරක වෙළඳ බලපත්‍ර ගාස්තු පැනවීම

**<u>නිවේදනය</u>**

කොටපොල ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂයේ අගෝස්තු මස 28 වන දින තීරණ අංක 2023/08/28/97යටතේ පහත දැක්වෙන තීරණය, තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එන්.එම්. දහනායක
ලේකම්
කොටපොල ප්‍රාදේශීය සභාව

2023 අගෝස්තු මස 28 වැනි දින,
කොටපොල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

**<u>තීරණය</u>**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ -

149 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ආ) ඡේදයෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, කොටපොල ප්‍රාදේශීය සභා පනතේ හෝ ඒ යටතේ සාදන ලද 1988.08.23 දින 520/7 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශිත සම්මත අතුරු ව්‍යවස්ථාව 2007.11.30 වැනි දින සභාව විසින් පිළිගෙන ඇති අතර, එම අතුරු ව්‍යවස්ථාවල 28 යටතේ කොටපොල ප්‍රාදේශීය සභා සීමාව තුළ කිසියම් තැනැත්තෙක් විසින් ආගමික උත්සව සඳහා හෝ වෙනත් යම් ජාතික උත්සවයක් සඳහා හෝ එම උත්සව ප්‍රදේශයේ උත්සව කාලසීමාව තුළ වෙළඳ කටයුතු සඳහා භාවිතා කරන බිම් ප්‍රමාණය මත වෙළඳුන්ට හෝ සංචාරක වෙළඳුන්ට උපලේඛණයේ අනුප්‍රමාණ අනුව බලපත්‍ර ගාස්තුවක්2024 වර්ෂය සඳහා පනවා අය කරන බව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වැනි වගන්තිය යටතේ කොටපොල ප්‍රාදේශීය සභාවේ ලේකම් වන නාඩකන්දගේ මල්ලිකා දහනායක වන මා විසින් තීරණ අංක 2023/08/28/97යටතේ තීරණය කරන්නීය.

**උපලේඛනය**

| *අනු අංකය* | *01 වන තීරුව* | *02 වන තීරුව*<br>*රු. ශත* |
|---|---|---|
| 01. | භාවිතා කරන බිම් ප්‍රමාණය වර්ග අඩි 20ට අඩු | 500.00 |
| 02. | භාවිතා කරන බිම් ප්‍රමාණය වර්ග අඩි 20ට වැඩි 100 ට අඩු | 1200.00 |
| 03. | භාවිතා කරන බිම් ප්‍රමාණය වර්ග අඩි 100 ට වැඩි | 3000.00 |
| 04. | එක් ජංගම කරත්තයක් සඳහා | 300.00 |